# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2372/15 – 2024 පෙබරවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා – 2024.02.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය:* IR/COM/04/2022/64.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එස්. ආර්. වීරද්දන මහතා, අංක 554, තල්දියාවල, අතුරුගිරිය.

*සහ*

CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්, අංක 18, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය, මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, පොල්හේන්ගොඩ, එඩ්මන්ටන් නිවාස, XB 10/3, නීතිඥ ඩී.ජී.කේ. කරුණාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/04/2022/64.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්. ආර්. වීරද්දන මහතා, අංක 554, තල්දියාවල, අතුරුගිරිය.

*සහ*

CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්, අංක 18, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ** –

"CML-MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් ආයතනයේ සේවය කළ එස්.ආර්.වීරද්දන මහතාට,

- 2019 අප්‍රේල් මාසයට අදාළ මාස භාගයක වැටුප හා
- කොවිඩ් 19 වසංගතය සමග නිවසේ සිටීමට දන්වූ 2020 මාර්තු මාසයේ සිට 2020 සැප්තැම්බර් මාසය දක්වා කාලයට වැටුප

සඳහා හිමිකමක් තිබේ ද හිමිකමක් තිබේ නම් එය නොලැබීමෙන් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ.).

2024 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 02-0156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.